#MediaethicsSL #SinhalaPress #Ika #Ravaya #Mawbima

මේ වනවිට සම්පූර්ණයෙන් මුහුණ ආවරණය වන ඇඳුම් පැළඳුම් නොකළ යුතු බවට පැනවී ඇති තහනම සමගින්, ඇතැම් මුස්ලිම් කාන්තාවන් අඳිනු ලබන බුර්කාව සහ නිකාබයද තහනම් වේ. කෙසේ වෙතත් පොදු සමාජයේ මේ වනවිට මුස්ලිම් කාන්තාවන්ගේ මුහුණ ආවරණය නොවෙන ඇතැම් ඇඳුම් පැළඳුම් වලට පවා නොඉවසා කමින් විරෝධතාවයන් එල්ල වන බව පෙනී යයි.

පසුගිය දිනක පුවක්පිටිය දෙමළ මහා විද්‍යාලයේ ගුරුවරියකටද එවැනි ගැටළුවකට මුහුණ දීමට සිදුවිණි. මුහුණ නොවැසෙන හිජාබය හැඳගෙන පැමිණි ඇයට විදුහලට ඇතුළු වීමට ඉඩ නොලැබුණේ, හිජාබය හැඳ පැමිණෙන්නන් පාසැල තුළට ඇතුළු කර නොගන්නා ලෙසට විශේෂ කාර්ය බලකායේ නිලධාරීන් තමන්ට පැවසූ බව කියූ විදුහල්පතිවරයා ඇයට පාසැලට ඇතුළු වීමට ඉඩ නොදුන් නිසාවෙනි. කෙසේ වෙතත් හිජාබයට ශ්‍රී ලංකා නීතියෙන් කිසිදු බාධාවක් එල්ල නොවේ.

මේ සිදුවීම වාර්තා කරනා මව්බිම පුවත්පත සඳහන් කරන්නේ අදාළ ගුරුවරිය 'නිකාබය' හැඳ සේවයට පැමිණි බවයි. ඒ ඔස්සේ අදාළ විදුහල්පතිවරයාගේ ක්‍රියාව සාධාරනීකරණය වෙයි. මෙහිදී පැහැදිලි වන්නේ අදාළ විදුහල්පතිවරයා හිජාබය සහ නිකාබය පටලවාගෙන ඇති බවයි. මව්බිම පුවත්පතද එක්කෝ හිජාබය සහ නිකාබය වරදවා වටහාගෙන අදාළ පුවත ඉදිරිපත් කොට ඇත. එසේත් නැතිනම් අදාළ පුවත සඳහා ඔවුන් යොදාගත් මූලාශ්‍රය විසින් සැපයූ තොරතුරු සාවද්‍ය වේ. ඒ කෙසේ වුවත් මෙය වර්තමානයේ ශ්‍රී ලංකාවේ පවත්නා තත්වයද පසුබිම් කරගනිමින් බැලූ විට සරල වැරදීමක් නොවන බව අපි සඳහන් කරමු